# ද්වාදසමො පාඨො

# සිප්පෙසු කොවිදො හොහි

එකදිවසං එකා වනිතා අත්තනො පුත්තෙන සද්ධිං විහාරං ගච්ඡති. අථ තස්ස පුත්තො එකං යාචකං දිස්වා මාතරං පුච්ඡති.

''කො'යං අම්මා'ති?

මාතා වදති - යාචකො'යං තාතා'ති

යාචකො අම්ම, කිං නාම කරොතී'ති?

සො කිර පුත්ත, භික්ඛං යාචති, භික්ඛාය එව ජීවිකං කප්පෙතී'ති.

අම්ම, භික්ඛාචාරං කිර දුක්කරං.

අථ කස්මා සො භික්ඛාය ජීවිකං කප්පෙතී'ති?

''එසො කිර පුත්ත අලසො. අනාරද්ධවිරියො. සො දහරකාලෙ කිඤ්චි සිප්පං උග්ගණ්හිතුං න වායමි. මාතාපිතූසු ආචරියස්ස සන්තිකං පෙසෙන්තෙසු'පි න කිඤ්චි උග්ගණ්හි. තස්මා සො කිඤ්චි ජීවනොපායං න ජානාති. සිප්පං අජානනෙන භික්ඛාය විනා කත්තබ්බං නත්‍ථී''ති.

''නාහං අම්ම, භික්ඛාය ජීවිතුං ඉච්ඡාමි. අහං පන සාධුකං උග්ගණ්හිස්සාමී''ති

''සාධු තාත, සාධුකං උග්ගණ්හිත්වා සබ්බසිප්පෙසු කොවිදො හොහි. අථ සුඛං ජීවාහී''ති

''විජ්ජා දදාති විනයං
විනයෙන භවති ඡෙකතා
ඡෙකතා දෙති සම්පත්තිං
තෙන ධම්මං තතො සුඛං''

පද මාලාව

| | | | |
|---|---|---|---|
| **වනිතා** | (නා) | - | වනිතාව |
| **අත්තනො** | (නා) | - | තමාගේ |
| **සද්ධිං** | (නි) | - | සමග |
| **යාචකං** | (නා) | - | යාචකයකු |
| **දිස්වා** | (පූ.ක්‍රි) | - | දැක |
| **මාතරං** | (නා) | - | මව |
| **පුච්ඡති** | (ක්‍රි) | - | විමසයි |
| **කොයං** | (සං) | - | මේ කවරෙක් ද? |
| **අම්ම** | (නා) | - | මෑණියනි |
| **යාචකොයං** | (සං) | - | මේ සිගන්නා |
| **කිර** | (නි) | - | වනාහි |
| **යාචති** | (ක්‍රි) | - | සිඟයි/ඉල්ලයි |

| | | | |
|---|---|---|---|
| **කපෙපති** | (ක්‍රි) | - | පවත්වයි |
| **භික්ඛාචාරං** | (ස) | - | සිඟමන |
| **දුක්කරං** | (කි) | - | අපහසු |
| **අලසො** | (නා) | - | කම්මැළි |
| **අනාරද්ධවිරියො** | (ස) | - | උත්සාහය නැත්තා |
| **දහරකාලෙ** | (ස) | - | කුඩා කාලයේ |
| **කිඤ්චි** | (නි) | - | කිසියම් |
| **සිප්පං** | (නා) | - | ශිල්පයක් |
| **උග්ගණ්හිතුං** | (තු) | - | ඉගෙන ගන්නට |
| **වායමි** | (ක්‍රි) | - | වෑයම් කළේය |
| **සන්තිකං** | (නි) | - | සමීපයට |
| **පෙසෙසුනෙන්තසු** | (කි) | - | යවද්දී |
| **ජීවනොපායං** | (සං) | - | ජීවනෝපායක් |
| **ජානාති** | (ක්‍රි) | - | දනියි |
| **අජානන්තෙන** | (කි) | - | නො දන්නා විසින් |
| **කත්තබ්බං** | (කි) | - | කළ යුතු |
| **ජීවිතුං** | (තු) | - | ජීවත් වීමට |
| **ඉච්ඡාමි** | (ක්‍රි) | - | කැමැත්තෙමි |
| **උග්ගණ්හිස්සාමි** | (ක්‍රි) | - | ඉගෙන ගනිමි |
| **සබ්බසිප්පෙසු** | (ස) | - | සියලු ශිල්පයන්හි |
| **කොවිදො** | (නා) | - | දක්ෂයෙක් |
| **විජ්ජා** | (නා) | - | විද්‍යාව |
| **දදාති** | (ක්‍රි) | - | දෙයි |
| **විනයං** | (නා) | - | විනය |
| **ඡෙකතා** | (ත) | - | දක්ෂ බව |
| **සම්පත්තිං** | (නා) | - | සම්පත් |

**අභ්‍යාස**

1. 'සිප්පෙසු කොවිදො හොහි' ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කෙ විහාරං ගච්ඡන්ති?
ii. කො යාචකං පස්සි?
iii. යාචකො කථං ජීවති?
iv. මාතා පිතරො යාචකං දහරකාලෙ කත්ථ පෙසෙසුං?
v. සබ්බසිප්පෙසු කොවිදො කථං ජීවති?

## සන්ධි I

ලෝප ආදේශ, ආගම ආදිය මගින් පූර්ව වර්ණය හා පර වර්ණය අතර හිඩැස නැතිවන සේ ගැළපීම සන්ධි නම් වේ. පූර්ව වර්ණය යනු පෙර පදයේ අග ඇති අකුර යි. පර වර්ණය යනු දෙවන පදයේ මුල ඇති අකුර යි.

කුසුමෙන + අනෙන = සන්ධි වන පද දෙක

කුසුමෙන් + අ + අනෙන

පූර්ව වර්ණය පර වර්ණය

පහත වගුව දෙස බලන්න.

| පූර්වපදය | පූර්වවර්ණය | පරවර්ණය | පරපදය |
|---|---|---|---|
| ලොක | අ | අ | අගෙගා |
| මුනි | ඉ | ඉ | ඉනෙදා |
| බහු | උ | උ | උපකාරං |
| සබෙබ | එ | එ | එව |
| සො | ඔ | අ | අපි |
| ති | ඉ | අ | අඞගිකං |
| සො | ඔ | ම් | මුනි |
| එවං | ං | ආ | ආදිනා |
| සොතුං | ං | ඉ | ඉචඡාමි |
| බුද්ධානං | ං | ස් | සාසනං |

### සන්ධි විධි

**ලොක** + **අගෙගා** යන දෙපදය **'ලොකගෙගා'** යනුවෙන් සන්ධි කිරීම සඳහා පූර්ව වර්ණය කපා හැරීමට සිදුවේ. ඉන් අනතුරුව පෙරපදයේ අග ඇති ව්‍යඤ්ජනයට **(ක්)** පර පදයේ මුල ඇති ස්වරය **(අ)** එකතු කළ යුතු ය. මෙසේ සන්ධි කිරීමට යොදා ගන්නා **ලෝප, ආදේශ, ආගම** ආදිය සන්ධි විධි නම් වේ.

පාලි භාෂාවේ සන්ධි විධි අටක් දක්නට ලැබේ.

1. ලෝපය
2. ආදේශය
3. ආගමය
4. ද්විත්වය
5. දීර්ඝය
6. හ්‍රස්වය
7. විපර්යාසය
8. ආරෝහණය

**ලෝපය** - ලෝපය යනු අකුරු නො පෙනීයාම යි. නො කියා හැරීම යි.

| | | | | |
|---|---|---|---|---|
| බුද්ධා | + | ඉති | | |
| බුද්ධා | + | ~~ඉ~~ | ති | ලෝපය |
| බුද්ධාති | | | | |

**ආදේශය** - අකුරක් වෙනුවට අකුරක් පැමිණවීම ආදේශය යි.

| | | | | |
|---|---|---|---|---|
| වස්ස | + | උදකෙන | | |
| වස්ස් | + | ~~අ~~ | උදකෙන | |
| වස්ස් | + | ඔදකෙන | | ආදේශය |
| වස්සොදකෙන | | | | |

**ආගම** - තිබෙන අකුරුවලට හානියක් නො කොට අමුතුවෙන් ම අකුරක් පැමිණීම ආගම යි.

| | | | | |
|---|---|---|---|---|
| පුන | + | ආගච්ඡති | | |
| පුන | + | ර් | ආගච්ඡති | ආගම |
| පුනරාගච්ඡති | | | | |

**ද්විත්වය** - අකුරක් අකුරු දෙකක් බවට පත්වීම ද්විත්වය යි.

| | | | | |
|---|---|---|---|---|
| ඉධ | + | පමාදො | | |
| ඉධ | + | ප් | පමාදො | ද්විත්වය |
| ඉධප්පමාදො | | | | |

**දීර්ඝය** - හ්‍රස්ව අකුරක් දීර්ඝ අකුරක් බවට වීම දීර්ඝය යි.

| | | | | |
|---|---|---|---|---|
| බහු | + | උපකාරං | | |
| බහ් | + | උපකාරං | | |
| බහ් | + | ඌ | පකාරං | දීර්ඝය |
| බහූපකාරං | | | | |

**හ්‍රස්වය** - දීර්ඝ අකුරක් හ්‍රස්ව අකුරක් බවට පත්වීම හ්‍රස්වය යි.

| | | | | |
|---|---|---|---|---|
| මහා | + | බලං | | |
| මහ් | + | ආ | බ්බලං | ද්විත්වය |
| මහ් | + | අ | බ්බලං | හ්‍රස්වය |
| මහබ්බලං | | | | |

**විපර්යාසය** - අකුරුවල ස්ථාන මාරුවීම විපර්යාසය යි.

| | | | | |
|---|---|---|---|---|
| බහු | + | ආබාධො | | |
| බහ් | + | ~~උ~~ | ආබාධො | |
| බහ් | + | ව් | ආබාධො | |
| බව් | + | හ් | ආබාධො | විපර්යාසය |
| බව්හාබාධො | | | | |

**ආරෝහණය** - ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වරයක් එක් කිරීම ආරෝහණය යි.

| | | | |
|---|---|---|---|
| තෙන | + | එව | |
| තෙන් | + | ~~අ~~ | එව |
| තෙනෙව | | | ආරෝහණය |

**අභ්‍යාස**

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ලෝප, ආදේශ හා ආගම යන සන්ධි විධි සඳහා උදාහරණය බැගින් සපයන්න.
ii. පූර්ව වර්ණය හා පර වර්ණය යනු මොනවා ද?
iii. සන්ධි විධි අට නම් කරන්න.
vi. පහත දැක්වෙන පදවල පූර්ව වර්ණය හා පර වර්ණය වෙන් කර දක්වන්න.

සිගාලො + අපි
නගරෙ + එව
අව + ලොකෙත්වා
පති + ආගමි
එවං + ආහ
සෙට්ඨී + ඨානං
දෙවානං + ඉන්දො
ජීවන + උපායං
දුක්ඛ + පත්තො
අහං + එව

2. 'සිප්පෙපසු කොවිදො හොහි' ඡේදයෙහි ඇති සන්ධි පද උපුටා විසන්ධි කර දක්වන්න.

3. පහත දැක්වෙන පදවල සන්ධි විධි නම් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| i. | වත | + | ඉදං | = වතිදං |
| ii. | අච්ඡරිය | + | පත්තො | = අච්ඡරියප්පත්තො |
| iii. | අථ | + | අපරභාගෙ | = අථාපරභාගෙ |
| iv. | සද්දං | + | අකාසි | = සද්දමකාසි |
| v. | ආකාසෙ | + | එව | = ආකාසෙව |
| vi. | ධූපෙන | + | එතෙන | = ධූපෙනෙතෙන |

4. පහත දැක්වෙන වාක්‍ය සිංහලට නගන්න.

i. අතීතෙ එකස්මිං වනසණ්ඩෙ සිගාලො විහාසි.
ii. පුරා ලඞ්කායං අනුරාධපුරපුලත්ථිපුරාදීනි නගරානි අහවිංසු.
iii. පුබ්බෙ විය සම්පති නගරෙසු ගොපුරං වා අට්ටාලකං වා නත්ථි.
iv. අජ්ජ අස්මිං නගරෙ ධූමරථට්ඨානඤ්ච, සන්දෙසාගාරඤ්ච, අධිකරණසාලාදයොපි ච සන්ති.
v. තෙන හෙතුනා ගාමිණීකුමාරො දුට්ඨගාමිණී'ති පඤ්ඤායි.

5. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩ වසන සේක.
ii. ඒ දේවතාවා එකත් පසෙක සිටියේය.
iii. සත්වයෝ ධර්මයෙන් සැප ලබත්.
iv. සූර්ය රශ්මියෙන් පියුම් පිපෙයි.
v. ඒ ශිෂ්‍යයෝ ගුරුවරයාගේ අවවාදය පිළිගත්හ.